# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2468/14 – 2025 දෙසැම්බර් මස 23 වැනි අඟහරුවාදා – 2025.12.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2016/54.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය) කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2019.02.14 වැනි දින අංක 2110/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 වැනි දින දරන නියෝගයෙන්,

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

සහ

ක්‍රිසි ෆුඩ්ස් ලිමිටඩ්, අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

අතර පවත්නා 2019.01.23 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන් නීතිඥ ඕබඩගේ ලීලාරත්න මහතා වෙත යොමු කරන ලදී.

බේරුම්කරණ විභාගයේදී ඇති වූ විරෝධතාවය හේතුවෙන් දෙවන පාර්ශ්වය විසින් නඩු අංක CA(Writ) 98/2020 යටතේ ගොනු කර ඇති අභියාචනාධිකරණ පෙත්සමේ නියෝගය අනුව යොමුව සංශෝධනයෙන් අනතුරුව නැවත යොමු කරන ලෙස කර ඇති දැනුම්දීම අනුව, යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින්, කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මා, එම නියෝගය අවලංගු කරන අතර, එකී 2019.02.07 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,
කම්කරු අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

EOG 12– 0213/1



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/04/2016/54.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වැනි වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

සහ

කැන්ඩි ඩිලයිට් ප්‍රයිවට් ලිමිටඩ් (ක්‍රිසි ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් - පෙර නම), අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242, නීතිඥ ඕබඩගේ ලීලාරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු,**
කම්කරු අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 12 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2016/54.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය, අංක 141, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 10.

සහ

කැන්ඩි ඩිලයිට් ප්‍රයිවට් ලිමිටඩ් (ක්‍රිසි ෆුඩ්ස් ප්‍රයිවට් ලිමිටඩ් - පෙර නම), අංක 98, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ,

“දෙපාර්ශ්වය අතර 1994.11.16 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම හා එහි යාවත්කාලීන කිරීම්වලදී ප්‍රසාද දීමනා ගෙවීම සඳහා එකඟතාවයක් ඇති වී තිබේද හා එසේ ඇති වී තිබේ නම් මෙම සේවකයින්ට ප්‍රසාද දීමනා සඳහා හිමිකම් තිබේද යන්නත් සහ මෙම පැමිණිල්ල ඉදිරිපත් කරනු ලබන වෘත්තීය සමිතියේ සාමාජිකයින් වන මෙම ආයතනයේ සේවය කරන ජේ. එම්. එස්. පෙරේරා මයා ඇතුළු සේවකයින් 38 දෙනාට ලබමින් සිටි වාර්ෂික ප්‍රසාද දීමනාවල 2015 අප්‍රේල් මාසයට නියමිත මුදලින් 25% ක් අඩුවෙන් ගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.”

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 දෙසැම්බර් මස 02 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

ඇමුණුම

1. ජේ. එම්. එස්. පෙරේරා
2. ජී. ආර්. ඒ. හේමන්තිකා
3. ඊ. ආර්. ආරියවතී
4. අයි. එස්. මාලනී
5. ඕ. ජී. සී. ප්‍රසාදිනි
6. කේ. පී. කේ. සිල්වා
7. එම්. ඒ. ඩී. මල්ලිකා
8. කේ. එස්. ප්‍රනාන්දු
9. ඩබ්. ඒ. සුනේත්‍රා
10. එම්. පී. ආර්. ප්‍රනාන්දු
11. එම්. එස්. සිල්වා
12. එල්. සී. ජී. එස්. කුමාර
13. එස්. ඒ. ටී. හර්ෂ
14. එම්. ඩබ්. ඒ. ආර්. හරිස්වන්ද්‍ර
15. පී. කුමාරසිරි
16. එන්. ඒ. එල්. අනුරුද්ධ
17. එස්. එම්. ඒ. ඉන්ද්‍රාණි
18. එම්. එල්. සිල්වා
19. ටී. සී. එම්. ප්‍රනාන්දු
20. කේ. එන්. ආර්. ප්‍රනාන්දු
21. ජී. ආර්. එල්. එන්. කේ. බණ්ඩාර
22. කේ. ආර්. එන්. ජයරත්න
23. ඩී. එම්. ටී. ඩී. මයිලෑව
24. ඊ. එන්. ප්‍රියංකා
25. පී. ජී. ඩී. ප්‍රසාද්
26. ඩී. ටී. ඩී. ප්‍රනාන්දු
27. එච්. එම්. පී. සිල්වා
28. ආර්. එම්. ආර්. කේ. රත්නායක
29. කේ. පී. එස්. කුමාර
30. ආර්. එම්. ඒ. එස්. සසලංක
31. ආර්. එම්. එම්. රත්නායක
32. එස්. ආර්. එම්. පෙරේරා
33. බී. ඒ. ඩී. එස්. ඩී. තිසේරා
34. එන්. ඒ. එච්. ආර්. නිශ්ශංක
35. එම්. ඒ. ජේ. එස්. කේ. මල්ලවආරච්චි
36. ටී. එම්. සී. එම්. තෙන්නකෝන්
37. එච්. ආර්. පී. සිල්වා
38. ඒ. ටී. එස්. නිරෝෂන්

EOG 12 – 0213/2

---

මගේ අංකය: IR/COM/02/2019/238.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

අංක 2412/41 දරන හා 2024.11.30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශ්වයක් වශයෙන් රාජගිරිය, කොටුවේගොඩ, ගැමුණු මාවත, අංක 292 හි පදිංචි ඩී. තිස්ස යාපා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් නුගේගොඩ, නාවල, තැ.පෙ. 21 හි පිහිටි ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 30/2022 දරන හා 2024.10.21 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩී. තිස්ස යාපා මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 30/2022 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මකවීම 2025.11.29 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 දෙසැම්බර් මස 09 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය

**"අ" ආකෘති පත්‍රය**

(3 වන නියෝගය)

**1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත**

**බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය: ඩී. තිස්ස යාපා,
අංක 292,
කොටුවේගොඩ,
රාජගිරිය.

දිනය: 2025.11.06

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2024.11.30 දිනැති අංක 2412/41 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දාවූ ද, ඩී. තිස්ස යාපා සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය බැඳී සිටින්නාවූ ද 2024.10.21 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන.

පිටපත: (අනෙක් පාර්ශ්වය) - උපකුලපතිතුමා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ.

CW/COM/031/201503/38

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තීය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්ති බලන්න.)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයෙකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 12– 0214

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.